**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව**

1 **තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

1.2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.2.1 **<u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත</u>**

**පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.**

| | | |
|---|---|---|
| (අ) | **ගිණුම්කරණ ප්‍රමිත අංක** 3 | **ස්කන්ධයේ සියළු වෙනස්වීම් පෙන්වන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.** |
| (ආ) | **ගිණුම්කරණ ප්‍රමිත අංක** 16 | **සමාලෝචිත වර්ෂය අවසානයේදී පාරිතෝෂිත ගෙවීම සඳහා රු.**268,407 **ක් වූ ප්‍රතිපාදනයක් කර තිබුණද, එම ප්‍රතිපාදන ආයෝජනය කර නොතිබුණු අතර ඒ බව මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි.** |
| (ඇ) | **ගිණුම්කරණ ප්‍රමිත අංක** 18 | **සමාලෝචිත වර්ෂයෙහි මිලදී ගත් රු.**9,172,481 **ක ස්ථාවර වත්කම් ක්ෂය කර නොතිබුණි.** |

### 1.2.2 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

**පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.**

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ | |
| 8 (i) වගන්තිය | මුදල් වර්ෂය ආරම්භ වී මාස 3 ක් ඉක්මයාමට පෙර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අයවැය ලේඛණය සම්මත කරගත යුතු වුවද, මෙම වාර්තාවේ දිනය දක්වාම සම්මත කරගෙන නොතිබුණි. |
| 14 (1) වගන්තිය | ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි - අංක 135 | මනා අභ්‍යන්තර පාලනයක් ඇති කිරීම සඳහා අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු වන පරිදි නිලධාරීන් දෙතුන් දෙනෙකුගේ අතරේ පරීක්ෂණයට භාජනය වන පරිද්දෙන් හැකි සැම අවස්ථාවකදීම රාජකාරී පැවරීම් කළයුතු වුවත් කොමිෂන් සභාවේ මාණ්ඩලික නිලධාරීන් 03 දෙනෙකු සිටියදී මූල්‍ය බලතල පැවරීම් නිලධාරීන් දෙදෙනකු අතරේ පමණක් සිදු කර තිබුණි. |
| (ඇ) චක්‍රලේඛ විධිවිධාන | |
| (i) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6:5:3 ජේදය | කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් අවසන්වරට සභාගත කර තිබුණේ 2008 |

| | |
|---|---|
| | **වර්ෂයේ වාර්ෂික වාර්තාව පමණකි.** |
| 8.3.5 (ඇ) ඡේදය | **සුදුසු වර්ගීකරණයක් යටතේ මිල ගණන කැඳවා අදාල සැපයුම්කරු සොයාගත යුතු වුවත් එම නියමයන්ට පටහැනිව වසර ගණනාවක සිට මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද රු.96,856 ක් වැය කරමින් එකම ආයතනයකින් පමණක් කුලී රථ සේවාව ලබා ගෙන තිබුණි.** |
| 8.3.7 ඡේදය | **අයවැය ලේඛණයේ සඳහන් නොවූ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවද රු.506,640 ක් වටිනා වත්කම් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.** |
| 9.6 ඡේදය | **වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම සඳහා කාර්ය සාධන ඇගයීමක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර 2011 වර්ෂයට සියළුම නිලධාරීන් සඳහා වැටුප් වර්ධක ලබාදී තිබුණද වැටුප් වර්ධක පත්‍රිකා කිසිවක් පෞද්ගලික ලිපිගොනුවල ගොනුකර නොතිබුණි.** |

1.2.3 **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවන ගනුදෙනු**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

(අ) **කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත ආපදා ණය ලබාදීමේදී මු.රෙ. 135 ප්‍රකාරව නිර්දේශ කිරීමට බලතල ලබා නොදුන් තනතුරු නාමයකින්,තනතුරට අදාල නොවන අයෙකු විසින් අත්සන යොදා රු.282,004 ක ආපදා ණය මුදලක් චෙක්පත් වලින් ගෙවීම නොකර මුදලින් ගෙවීම් කර තිබුණි.**

(ආ) විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් සඳහා පර්යේෂණ සහකාරවරුන් දෙදෙනකු සමාලෝචිත වර්ෂයේ ජූනි මස සිට සේවයේ යොදවා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ විය.

- උක්ත නිලධාරීන් දෙදනාට මාසික ඉදිරි වැඩ සටහන් අනුමත කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී දීමනා වශයෙන් රු.205,850 ගෙවීමක් සිදු කර තිබුණි.

- උක්ත නිලධාරීන් දෙදෙනාගේ කාර්ය සාධන වාර්තාවන් පරීක්ෂා කිරීමේදි එකම කාර්යය නිලධාරීන් දෙදෙනාම සිදුකර ඇති අවස්ථාද ආයතනයේ වෙනත් නිලධාරියකුගේ රාජකාරි ලැයිස්තුවට අදාල වූ කාර්යයන් ද ඉටුකර ඇති අවස්ථා නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය වූ රු.12,662,000 ක් ගණන් ගැනීමෙන් පසු සභාවේ වැඩ කටයුතු වලින් රු. 808,065 ක ඌනතාවයක් වූ අතර,ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් වූ රු.13,325,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය

රු. 776,544 ක අතිරික්තයක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,584,609 ක පිරිහීමක් දක්නට ලැබුණි.විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලද රජයේ ප්‍රදානය රු.2,279,400 කින් අඩුවීම මෙයට හේතුවිය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලසුමේ සඳහන් කර ඇති ඉලක්ක සපුරාගත නොහැකි වීම පිළිබඳව වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත ඇස්තමේනුගත පිරිවැය රු.මි.1.225 ක්වූ කාර්යයන් 04ක් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.2.74ක් වූ කාර්යයන් 03 ක් සඳහා වර්ෂය තුල වියදම් කර තිබූ ප්‍රමාණය රු.මි.0.8867 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී කොමිසම විසින් විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් වෙනුවෙන් දරන ලද වියදම් පිළිබඳව වු මුල්‍යමය කාර්ය සාධනය පහත පරිදි විය.

(i)

| ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව පුරෝකථන වාර්ෂික වියදම | විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් වෙනුවෙන් සත්‍ය වියදම | වියදම හා ඇස්තමේන්තුව අතර පරතරය | කාර්ය සාධනයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| රු.මි. | රු.මි. | රු.මි. | % |
| 4.165 | 0.887 | 3.278 | 21.29 |

(ii) වර්ෂ පහක කාලයක විද්‍යා හා තාක්ෂණ ක්‍රියාකාරකම් වෙනුවෙන් කොමිසමේ කාර්ය සාධනය පහත පරිදි විය.

| වර්ෂය | ඇස්තමේන්තුගත වියදම | සත්‍ය වියදම | වෙනස | කාර්යසාධන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු . | % |
| 2011 | 4,165,000 | 887,267 | 3,277,731 | 21.30 |
| 2010 | 6,090,000 | 3,320,008 | 2,769,992 | 54.52 |
| 2009 | 3,145,000 | 990,286 | 2,154,714 | 31.48 |
| 2008 | 6,501,000 | 2,943,509 | 3,557,491 | 45.28 |
| 2007 | 2,800,000 | 1,632,428 | 1,167,572 | 58.30 |

(iii) ද්වි වාර්ෂික සමුළුව සඳහා පමණක් දරන ලද වියදමට අමතරව අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා කොමිසමේ කාර්යසාධනය මේ අනුව ඉතා පහල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

| වර්ෂය | ඇස්තමේන්තුව | සත්‍ය වියදම | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| 2011 | 3,665,000 | 887,269 | 2,777,731 | 24.26 |
| 2010 | 3,090,000 | 778,505 | 2,311,495 | 25.19 |
| 2009 | 3,145,000 | 980,431 | 2,164,569 | 31.17 |
| 2008 | 3,546,000 | 948,046 | 2,597,954 | 26.74 |
| 2007 | 2,800,000 | 1,632,428 | 1,167,572 | 58.38 |

3.2 **කළමණාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැඩ බැලීමේ තනතුරක් දීර්ඝ කාලයක් නොපුරවා තබා ගෙන සිටින අවස්ථාවලදී එම තනතුර තවදුරටත් තබාගැනීමේ අවශ්‍යතාවය අදාල අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විමසා බැලිය යුතුවේ. කෙසේවුවද 2010 අගෝස්තු 01 දින වැඩ බැලීමේ තනතුරක් සඳහා කොමිසමේ අධ්‍යක්ෂ ලෙස පත්වීම් ලද තනතුරුලාභියා එවැනි අවශ්‍යතාවයක් සම්පූර්ණ නොකර වර්ෂ 01 මාස 04 ක කාලයක් අඛණ්ඩ සේවයේ යොදවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නොබැදි ජාතීන්ගේ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය වෙත (නාම් මධ්‍යස්ථානය) 2011/2012 වාර්ෂික දායකත්වය වෙනුවෙන් රු.1,106,693 ක් ගෙවා තිබුණද 2011 වර්ෂයේදී එම දායකත්වය වෙනවෙන් නිලධාරීන් 03 දෙනෙකු පමණක් සහභාගි වී තිබීමෙන් මේ රටේ විද්‍යාභිවර්ධනයට ප්‍රමාණවත් නොවන අයුරින් සීමිත ප්‍රතිලාභයක් ලබාදී තිබුණි.

නාම් මධ්‍යස්ථානයේ ශ්‍රී ලංකා කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස 2001 වර්ෂයේ සිට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂම ක්‍රියාත්මක වන අතර මෙම කාලය තුළදී විවිධ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වු සීමිත නිලධාරීන් පිරිස මෙරටට පැමිණි පසු තමන් ලද පුහුණුව තුළින් මෙරටේ විද්‍යාභිවර්ධනයට සිදු කරන ලද දායකත්වය පිළිබඳ පසු විපරම් සිදුකර නොතිබුණි.

3.3 **කාර්ය මණ්ඩල පරිපාලනය**

**පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

(අ) **ආයතනයේ රියදුරු තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය 03 දෙනෙකු වු අතර ආයතනය සතුව ඇති වාහන සංඛ්‍යාව 01 ක් විය. මේ අනුව අතිරික්ත රියදුරන් දෙදෙනා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.323,040 ක වැටුපක් ගෙවීම් කර තිබුණි.**

(ආ) **ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් එම්ඒ-1-2-2006 වැටුප් කාණ්ඩය යටතේ 2003 වර්ෂයේදී බඳවා ගත් නිලධාරිනියකගේ වැටුප් සංශෝධනය කිරීමේදී ඇයට හිමි විය යුතු වැටුප් පියවරට වඩා වැටුප් පියවර 08 ක් ඉදිරියෙන් තබා වැටුප් සකස් කිරීම නිසා 2012 පෙබරවාරි 15 දින වන විට රු.300,126 ක මුදලක් වැටුප් වශයෙන් වැඩිපුර ගෙවීම් කර තිබුණි.**

(ඇ) **කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 16 දෙනෙකු වු අතර තථ්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 13 දෙනෙකු විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 03 දෙනෙකුගේ පුරප්පාඩුවක් දක්නට ලැබුණි.**

4. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **අභ්‍යන්තර විගණනය**

**කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයන් වෙන් වශයෙන් පිහිටුවා නොතිබුණ අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණනය සිදු කර තිබුණද සමාලෝචිත වර්ෂය වෙනවෙන් එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි.**

4.2 **විගණන හා කළමනාකරණ කමිටු**

**කොමිෂන් සභාව පිහිටුවා වසර 12 ක් ගත වී ඇතත් මෙතෙක් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි.**

4.3 **අයවැය ලේඛනමය පාලනය**

(අ) **සමාලෝචිත වර්ෂය සඳහා කොමිසම විසින් සකස් කරන ලද මිලදී ගැනීමේ සැලැස්ම ප්‍රකාරව වර්ෂයේ ඇස්තමේන්තු ගත වියදම රු.මි.1.33 ක් විය. මිලදී ගැනීමේ ඇස්තමේන්තුව තුළ සඳහන් නොවු වත්කම් වර්ග 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් වර්ෂය තුළ දී රු.506,640 වැයකර තිබුණි.**

## 5. **පද්ධති හා පාලන**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.**

(අ) **පෞද්ගලික, ලිපිගොනු, යාවත්කාලීන කිරීම**

(ආ) **අභ්‍යන්තර විගණන වැඩසටහන් සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම**

(ඇ) **සේවක පඩිනඩි**

(ඈ) **පැමිණීමේ හා නිවාඩු ලේඛනය**

(ඉ) **වැටුප් වර්ධක සටහන් පෞද්ගලික ලිපිගොනු වලට ගොනු නොකිරීම**

(ඊ) **මු.රෙ. 135 යටතේ බලතල බෙදා හැරීම**

(උ) **ගිණුම්කරණය (ස්ථාවර වත්කම් ක්ෂය,ජර්නල් සටහන් පිළයෙල කිරීම යනාදිය )**

(ඌ) **බැංකු සැසඳුම් පිළියෙල කිරීම**